# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 71 දරන ප්‍රේමදාස හැගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 දෙසැම්බර් මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **5.00 යි.**

## 2009 අංක 71 දරන ප්‍රේමදාස හැගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 18 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 34/2007

**ප්‍රේමදාස හැගොඩ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"ප්‍රේමදාස හැගොඩ පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද එකී පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබ හා ඉටු කරනු ලැබ ඇති හෙයින් ද, ඒ සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 71 දරන ප්‍රේමදාස හැගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රේමදාස හැගොඩ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ප්‍රේමදාස හැගොඩ පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරිය ඒ සංස්ථාවට ඇත්තේ ය. ප්‍රේමදාස හැගොඩ පදනම සංස්ථාගත කිරීම.

3. (1) සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) අනාථ සහ අවතැන් වූ ළමයින් සඳහා සුභසාධන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ආ) ආබාධිත, අංගවිකල සහ මන්ද බුද්ධික දරුවන් රැක බලා ගැනීම සහ ඔවුන්ගේ අනාගත සුභසිද්ධිය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ආධාර සැපයීම ;

(ඇ) මන්දබුද්ධික හෝ අංගවිකල හෝ අවතැන් වූ දරුවන් සඳහා අවශ්‍ය වෘත්තීය පාඨමාලා ආරම්භ කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සැලසීම ;

(ඈ) දේශීය සහ විදේශීය ආයතනවල සහයෝගීතාවය ඇතිව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර පවත්වාගෙන යාම ;

(ඉ) මේ සංස්ථාව හා සමාන සමාජ අරමුණු ඇති සමාජ සේවකයන්, විද්‍යාඥයන්, පරාර්ථකාමීන් සහ දේශීය සහ විදේශීය සුභසාධන සමාගම් අතර සුහදතාවය සහ සහයෝගය වැඩිදියුණු කිරීම ;

(ඊ) සංස්ථාවේ භාවිතයට මෙන්ම සංස්ථාවේ යහපත සඳහා විදේශයන් හි සිට පැමිණෙන තැනැත්තන්ගේ භාවිතයට අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම සහ එම කාර්යය උදෙසා පහසුකම් සහ උපකරණ සැපයීම සහ පවත්වාගෙන යාම ;

(උ) තරුණ පරපුරට යහපත් සාරධර්ම සහ ඔවුන්ගේ පෞරුෂ වර්ධනයට හේතු වන නිවැරදි හැසිරීම් රටාවන් පිළිබඳ ඉගැන්වීම ;

(ඌ) රටේ යහපත් පුරවැසියන් බවට පත් වීමට අවශ්‍ය සෑම කටයුත්තකදී ම ළමයින්ට සහායවීම ;

(එ) අඩු ආදායම් ලබන පවුල්වල යහපත පිණිස පෙර පාසල් පිහිටුවා පවත්වාගෙන යාම සහ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පාඨමාලා පැවැත්වීම ;

(ඒ) උපකරණ සැපයීම සහ පහසුකම් සැලැස්වීම සහ කලාකරුවන්ගේ අයිතීන් සහ සුභසාධනය දිරිගැන්වීම සහ ආරක්ෂා කිරීම මගින් පාරම්පරික සංස්කෘතික කලාව ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) වෙනත් රටවල් සමග සංස්කෘතික හුවමාරු වැඩසටහන් සංවිධානය කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමට සහාය දැක්වීම සහ වඳවීගෙන යන සත්ත්ව විශේෂ, සතුන්, කුරුල්ලන්, මාළුන් සහ උරගයන් ආරක්ෂා කිරීම සහ අදාළ ආයතනවලට සියලු සහාය දැක්වීම ;

(ක) සම්මන්ත්‍රණ, වැඩමුළු, ව්‍යාපෘති සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ මේ ක්ෂේත්‍රය පිළිබඳ දේශීය සහ විදේශීය ආයතන සමග සබඳතා පවත්වාගෙන යාම ; සහ

(ග) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම.

2. (1) වන උපවගන්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමේදී, එම ක්‍රියාත්මක කිරීම, ජාතිය, කුලය, ආගම, භාෂාව ස්ත්‍රී පුරුෂ භාවය හෝ දේශපාලන මතය මත වන වෙනස්කමකින් තොරව ක්‍රියාත්මක කරනු ලබන බවට සංස්ථාව වගබලා ගත යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ රීතිවලට අනුකූලව සාමාන්‍ය මහ සභා රැස්වීමක දී තෝරා පත් කර ගනු ලබන්නා වූ සභාපති, ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික සහ සහකාර භාණ්ඩාගාරික සහ කමිටු සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වූ, කළමනාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන සංගමයේ පරිපාලනය මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, ඔවුන් සංස්ථාවේ ප්‍රථම වාර්ෂික මහ සභා රැස්වීම පවත්වනු ලබන තෙක් ධුර දැරිය යුතු ය.

සාමාජිකත්ව නාම ලේඛනය.

5. කළමනාකරණ මණ්ඩලය විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භයේ දී සංස්ථාවේ සාමාජිකයකු වූ ද, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ ඉන් පසු යථා පරිදි ඇතුළත් කරගනු ලබන්නා වූ ද, සෑම සාමාජිකයකුගේ ම නම ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය :—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ද ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට ;

(ආ) මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට හා මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම ;

(ඇ) සංස්ථාවට අයත් යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදි කිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම ;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලයට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට හා ඒ ගිණුම් වසා දැමීමට ;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කළමනාකරණ මණ්ඩලය විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නීත්‍යානුකූල භාර කිසිවක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ; සහ

(උ) සංස්ථාවේ කාර්යය සඳහා සේවක පිරිස් ශ්‍රී ලංකාවෙහි හෝ විදේශයන්හි පුහුණු කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

7. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියළු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) කළමනාකරණ මණ්ඩලය තෝරා පත් කර ගැනීම, ඔවුන් ධුරයෙන් හිස් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ කළමනාකරණ මණ්ඩලයේ බලතල, කාර්යය, කර්තව්‍ය හා චර්යාව ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන් සේවයෙන් නෙරපීම, ඔවුන්ගේ බලතල, කාර්යය, කර්තව්‍ය, චර්යාව සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම ;

(ඈ) සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ හෝ එහි යම් අනුකාරක සභාවක රැස්වීම් කැඳවීමේ දී හෝ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒවායේ පූරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම් සඳහා ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ;

(ඉ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන පරිද්දෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

ගිණුම් සහ විගණනය කිරීම.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳවත්, අනෙකුත් සියලු ගණුදෙනු පිළිබඳවත්, නිසි ගිණුම් පවත්වාගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ව්‍යාපාරික සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නියාදනයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතුකර දෙනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා හැකියාව හා ශක්නුතාව තිබිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ පදනමේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදින වන විට පදනමට අයවිය යුතු සියලු ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියළු ණය සහ බැරකම් ගෙවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරිව ඇත්නම් එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ එහි යම් ආදායමක් හෝ දේපළක් එහි සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ලබා දීම හෝ මාරු කිරීම කළ යුතු ය. එම ආයතනය හෝ ආයතන, සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාවේ සභාපතිවරයා හෝ ඔහු නොමැති විට කළමනාකරණ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.